සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
**Western Province Education Department - Colombo Educational Zone**

# දෙවන වාර ඇගයීම
# இரண்டாம் தவணை பதிப்பீடு - 2015
# Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 11 | විෂයය / பாடம் / Subject : සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper : I | කාලය / காலம் / Time : පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

(01) <u>නමෝ විත්තියෙන්</u> උත්සවයේ වැඩ පටන් ගත යුතු බව සභාපතිතුමා ප්‍රකාශ කළේ ය.
(1) උපක්‍රමයෙන් (2) ප්‍රථමයෙන් (3) පොතට අනුව (4) ආරාධනයෙන්

(02) ලොකු පුතා <u>හිරයක් අරගෙන</u> ඈත ප්‍රදේශයක පදිංචි වී ඇති බව දැනගන්නට ලැබිණි.
(1) අත්අඩංගුවට ගෙන (2) ඉඩමක් රැගෙන
(3) රැකියාවක් ලබාගෙන (4) විවාහයක් කරගෙන

(03) කිසියම් <u>උප්පරවැට්ටියකට</u> තමා හසුවී ඇති බව පසුව ඔහුට අවබෝධ විය.
(1) ප්‍රයෝගයකට (2) අතමාරුවකට (3) සිරගෙයකට (4) කරදරයකට

- **අංක 04 සිට 07 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) එම අර්බුදය ........................................ ක්‍රියා මාර්ගයකින් විසඳා ගැනීමට කළමනාකරු උත්සාහ කළේ ය.
(1) ප්‍රසිද්ධ (2) සාමකාමී (3) විශ්ලේෂණ (4) සුරූපී

(05) බුද්ධිමත් පුද්ගලයා ................................ වීම කිසි ලෙසකින් විය යුත්තක් නොවේ.
(1) ආවර්ජනය (2) ආදානග්‍රාහී (3) ආකස්මික (4) අනවරත

(06) මහ පොළොවේ සාරය ........................................ පැළෑටිය හොඳින් වැඩී තිබුණේ ය.
(1) උකහාගෙන (2) උද්වහනය කොට (3) උද්වේගකර (4) උත්සුක කොට

(07) එම කැනීම්වලින් හමු වූ ඇතැම් පුරාවස්තුවල කාලය ........................................ කිරීම ලෙහෙසි පහසු නොවේ.
(1) නිවාරණ (2) නිර්ණය (3) නිරුද්ධ (4) නිර්දිෂ්ට

- **අංක 08 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.**

(08) (1) ධර්මිෂ්ට , දේශණය , මහලු , පිළිවෙල
(2) දරුණු , විෂඝෝර , කෘෘර , සාමණේර
(3) මණ්ඩපය . සංක්ෂිප්ත , ප්‍රගුණ , විශ්වය
(4) තාක්ශනය , දෙරන . ඇතුළ , දිළිඳු

(09) (1) කැකුළ , කාර්යාලය , අභිලාෂය , උලෙළ
(2) සමස්ථ , උච්චාරණය , ශාතිශය , පරිකතා
(3) මණ්ඩලය . විපර්යාෂය , යථාර්ථවාදය , ආබාධ
(4) සනත්වය , මර්ධනය , වර්ධනය , පිළිඹිබුව

(10) (1) දෘෂ්ඨිය , දෝෂාරෝපනය , ජ්‍යෂ්ඨ , ස්වාදීන
(2) කනිෂ්ඨ . මුඛ්‍යාර්ථය , ඡේදනය , ස්තූප
(3) ප්‍රභේද , වාර්ථාව , සංවිධාන , එලවලු
(4) ආස්වාශ , සාධක , යුවල , ආභරණ

(11) අකාරාදී පිළිවෙළ **නිවැරදිව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සිරිසේන , සිරිවර්ධන , සිරිසෝම , සිරිපාල
(2) කුමාරසිංහ , කුමාරදාස , කුමාරතුංග , කුමාරගම
(3) ගුණසේකර , ගුණසිංහ , ගුණවර්ධන , ගුණානන්ද
(4) විමලපාල , විමලරත්න , විමලවර්ධන , විමලසේන

(12) පහත පද පේළි අතරින් යුගල පදයක් **නොවන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) ගෝරිබෝරි , ගරුසරු , අහුමුළු , අඟර දඟර
(2) ගුණදොස් , කසුකුසු , මුදල් හදල් , අටුකොටු
(3) පොතපත , ඇහැකන , කතාබහ , අකටවිකට
(4) ගරුනම්බු , ලේසිපාසු , පරපණ , ඇනුම් බැනුම්

(13) පාපිල්ල, හල් කිරීම, රේඵය, ඇලපිල්ල යන පිල්ලම් පිළිවෙළින් යෙදී **ඇති** වරණය තෝරන්න.
(1) නුවර , සම්මත , ධර්‍මය , පාලම
(2) කුසලය , පිරියම් , කෘතිය , රුකවල්
(3) මුද්‍රන , ශක්තිය , ප්‍රමාණය , ආහාර
(4) උතුර , දෙව්රම , වර්‍ෂය , එතැන

(14) විරාම ලකුණු **නිවැරදිව** යෙදුණු වාක්‍යය තෝරන්න.
(1) දයාබර දරුවනි, අලස නොවී, උගනිවු
(2) අද විවේකයෙන් පසු ළමයින්ට "නිවාඩු" දෙනවා. පන්තියේ, ආචාර්ය අබේගුණවර්ධන මහතා කීය.
(3) පෙ ව 10.30 , 10.50 දක්වා කාලය. විවේකය සඳහා. වෙන්කර ඇත.
(4) සිදත් සඟරාවේ "නැළි" වශයෙන් ද සීගිරි ගීවල "නෙළිඑල" වශයෙන් ද පොල් හඳුන්වා ඇත.

(15) සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ඉක්බිති - පසුව , අනතුරුව , තදනන්තර , ඊටපසු
(2) ආධාරය - උපකාරය , උදව්ව , අනුබලය , පිටුවහල
(3) ඉක්මන - යුහුසුලු , ශීඝ්‍ර , හනික , අප්‍රමාද
(4) කටුක - කඨෝර , කර්කශ , කාෂ්ට , රූක්ෂ

(16) මුලින් යෙදී ඇති පදයේ **විරුද්ධ** අර්ථය දෙන පදයක් සහිත පිළිතුර තෝරන්න.
(1) උත්කෘෂ්ට - ශ්‍රේෂ්ඨ , අග්‍රගණ්‍ය , නිකෘෂ්ට , විශිෂ්ට
(2) දරිද්‍ර - දිළිඳු , දුගී , දුප්පත් , නිර්ධන
(3) උචිත - සුදුසු , නිසි . යෝග්‍ය , නියම
(4) අවිනීත - අශිෂ්ට , ම්ලේච්ඡ , අසභ්‍ය , අශීලාචාර

(17) ආදී ශ්‍රී ලාංකිකයාගේ ජලවේග පාලන තාක්ෂණික ඥානයේ දියුණුව පෙන්නුම් කරන්නේ,
(1) සැමට ජලය ලබා දීමේ ක්‍රම ශිල්පයෙනි.
(2) ඇළ මාර්ගවලින් ගෙනෙන ජලය වතුරමල්වලින් පිට කිරීමෙනි.
(3) වැවට අධිපති දෙවියන්ට බාර වී සිදුකරන නිහර වී පූජාවෙනි.
(4) වැවට ගලා එන රොන් මඩ රඳවා ගන්නා වැව් තාවුල්ලෙනි

(18) එක් එක් පේළියෙහි පද තුනක් හා ඒවායේ තේරුම දී ඇත. තේරුම **වරදවා** දී ඇති පදයක් ද සහිත පේළිය තෝරන්න.
(1) අඩුක්කු හැළි - බුදුන්ට දෙවියන්ට ආහාර පිසින හැළි , කුඹගස් - රුවල් බඳින කණු , හර පද්ධතිය - වටිනාකම්
(2) ආහ්ලාදය - සතුට , අලාමක - පැසුණු , සලඹ - පා වළලු
(3) පෙඳ - තටු , දිය නඳන - බෝසතුන් , පර්ෂද - පිරිස
(4) අත්‍යන්තයෙන් - අතරතුර , අටසාලිස් - හතළිස් අටක්, රකවල් පළ - හේනේ පැල

(19) ශ්‍රී ලාංකිකයෙකුගේ ආහාර වේලක පොල් සම්බෝලයට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදය වන්නේ,
(1) ආහාර (2) විශේෂ (3) සම්බෝලයට (4) ලාංකිකයකුගේ

(20) **වැරදි** ව්‍යාකරණ විග්‍රහය දෙන වරණය තෝරන්න.
(1) අම්මා විසින් මම සනසනු ලැබීමි. යන වාක්‍යය කර්මකාරක වාක්‍යයකි.
(2) මම ගායකයෙක් වෙමි. යන වාක්‍යය ද්විත්ව උක්තය සහිත වාක්‍යයකි.
(3) සොර මුළ ගෙවල් බිඳිති. යන වාක්‍යයේ සොර මුළ යන්න සමූහාර්ථවාචී පදයකි.
(4) ප්‍රාණවාචී පදවලට "ඕ" "හු" ප්‍රත්‍ය යෙදූ විට නිත්‍ය බහුවචන පද බවට පත් වේ.

(21) "කඩයි" යන ක්‍රියා පදයේ ප්‍රථම පුරුෂ, ස්ත්‍රී ලිංග කර්තෘකාරක, අතීත කාල ඒකවචන රූපය ඇතුළත් වරණය තෝරන්න.
(1) කඩන්නීය (2) කැඩුවාය (3) කැඩිණි (4) කැඩුවෙමි

(22) කෘදන්ත නාමයක් යෙදී **නැති** වරණය තෝරන්න.
(1) බඹර කපා පැණි සැමටම බෙදන්නා
(2) පාරුව පදින තුරු සයුරේ සෙලවිල්ල
(3) ඌ පෙඳ වැඩී නිදහස් රස විඳින තුරා
(4) බලවි පොළොන්නරු අනුරාපුර පෙදෙස

(23) මුලින් දී ඇති සමාස වර්ගයට අයත් පද පමණක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) විභක්ති සමාසය - ගත්කරු, ගුරු පඬුරු , මව්කිරි , ගම්වැසි
(2) අන්‍යාර්ථ සමාසය - තිලෝනා , දිනකර , මලව් , සියපත්
(3) විශේෂණ සමාසය - හුඹස් කට, තෙරුවන , කිරිදත් , මල් හිනාව
(4) අව්‍ය සමාසය - කුමන්ත්‍රණ . අනුගාමී , අපමණ , සුදු හඳුන්

(24) පහත යෙදුම්වලට ගැළපෙන **තනි පද** නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
- එක ම අරමුණක නැති
- තීරණයක් ගැනීමට අපහසු වී සිටින
- බොහෝ සෙයින් කතා බහ කරන
- සැමදා පවත්නා වූ

(1) දෙගිඩියාව , වික්ෂිප්ත , වාචාල , ඉර හඳ පවත්නා තුරු
(2) අනිස්ථිර , අතීරණය , ආලාප , ස්ථම්භ
(3) වික්ෂිප්ත , දෙගිඩියාව , කටකතා , සදාකාලික
(4) වික්ෂිප්ත , දෙගිඩියාව , මුඛරි , සදාකාලික

◆ අංක 25 සහ 26 ප්‍රශ්නවල එක් එක් පේළියේ මුලින් දී ඇති පදය නිවැරදි ව විසන්ධි කොට ඇති වරණය තෝරන්න.

(25) (1) ඔබිනොබ - ඔබින් + ඔබ (2) වෙණුදුරු - වෙණු + ඇදුරු
(3) මුද්‍රණාලය - මුද්‍රණා + ආලය (4) බුද්ධීන්ද්‍රිය - බුද්ධිය + ඉන්ද්‍රිය

(26) (1) පිළියම් - පිළි + අම් (2) දුරාචාර - දුරු + ආචාර
(3) වැල්ලම්පිටිය - වැලි + අඹපිටිය (4) රුක්කත්තන - රුක් + අත්තන

(27) වන සත්තු සිය පැටවුන් ආදරයෙන් රකිති.
යන වාක්‍යය කර්ම කාරකයට හැරවූ විට නිවැරදි පිළිතුර වන්නේ,
(1) වන සතුන් විසින් සිය පැටවු ආදරයෙන් රකේ.
(2) වන සතුන් විසින් සිය පැටවු ආදරයෙන් රකිනු ලබති.
(3) වන සතුන් විසින් සිය පැටවුන් ආදරයෙන් රකිනු ලදහ.
(4) වන සතුන් විසින් සිය පැටවු ආදරයෙන් රකිනු ලබයි.

(28) පහත කවි දෙපදය කියවා දී ඇති **වැරදි** ප්‍රකාශය තෝරන්න.
"කටු රොද මඩ වගුරුවල මානෙල් ඕලු
මැණිකෙගෙ මුහුණ දැකුමට පොරකන වාලු"
(1) මැණිකෙගෙ සොඳුරු බව ව්‍යංග්‍යයෙන් පවසා ඇත.
(2) මුහුණේ පියකරු බව විසිතුරු චිත්ත රූපයකට ගෙන ඇත.
(3) කවියා මෙම කවි දෙපාදයෙහි එළිසමය ආරක්ෂා කොට ඇත.
(4) මේ කවි දෙපදයේ ඇත්තේ වචනවල මතුපිටින් කියැවෙන අර්ථය පමණි.

◆ අංක 29 - 30 දක්වා ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(29) යමක් තේරුම් නොගෙන ක්‍රියා කිරීම
(1) ගමරාළගේ කුරහන් පිට්ටුව වගේ
(2) අන්දරේ සීනි කෑවා වගෙයි.
(3) සෙක්කුවේ බැන්ද හරකා වගේ
(4) හතර බීරි කතාව වගෙයි.

(30) යම් කාර්යයක් දිගට ම කරගෙන යාම
(1) කැත්තට පොල්ල වගෙයි.
(2) බට කැලේට ගිනි තැබුවා වගෙයි.
(3) පෝය හේවිසිය වගෙයි.
(4) බක තපස් රකින්නා වගෙයි.

◆ අංක 31 - 33 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.

(31) (1) හෝටලයක වැඩට දක්ෂ කෝකියන් ඕනෑකර තිබේ.
(2) ළමයි සෙල්ලම් කරද්දී අම්මා වැඩට ගියා ය.
(3) මම වැඩට යති'යි මිනිස්සු සිතූහ.
(4) ඇ ගායිකාවක ද වෛද්‍යවරියක්ද වූවා ය.

(32) (1) එම එම නවකතාව කියවා ඇත.
(2) ඔවුන් විසින් අප දක්නා ලදහ.
(3) කැලණි නදීතොමෝ සමුද්‍රය කරා ගලා බසියි.
(4) ප්‍රේක්ෂකයන් සියලුදෙනා එම නාට්‍යය සතුටින් නැරඹූහ.

(33) (1) පරිසරයට ආදරය නොකරන්නා පරිසරය විසින් විනාශ කරනු ලබති.
(2) මෙවර සාහිත්‍ය සඳහා ත්‍යාගය දිනාගත්තේ කවුරුන්දැයි රසිකයන් බලා සිටිති.
(3) මෙවර වාර විභාගයෙන් අප උසස් ලෙස සමත් වෙත්වා!
(4) රූපවාහිනිය බාධාවක් කර නොගත් ප්‍රඥාදාස උසස් ලෙස විභාගය සමත් විය.

(34) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට ඇතුළත් **නොවන** පද ඇති පද පේළිය තෝරන්න.
(1) නිපාත - කටුව . වනාහි , ඉතින් , පිණිස
(2) තද්ධිත - ලෞකික , කවුසාණෝ , ඉහළ , සුවඳ
(3) මිශ්‍ර ක්‍රියා - කඩකඩා , පිසිමින් , කකා , ගසගසා
(4) විභක්ති - පුතුනි , ගසින් , සියොතුන්ගේ , තෙරණියක

◆ අංක 35 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

(35) මහා පරිමාණ වැව්වල දක්නට ඇති සුවිශේෂී ඉදිකිරීමක් වන රළපනාව වැවේ ඇතුළු බඳ ජලයෙන් සේදීමෙන් වළක්වා ගැනීම සඳහා අතුරා ඇති ගල්පඩි පෙළකි.
(1) රළපනාව ඉදිකර ඇති වැව්වල ජලයෙන් සේදීයාම වළක්වා ගන්නට අතුරා ඇති ගල්පඩි පෙළක්
(2) වැවේ ඇතුළත සේදීම වළක්වා ගැනීමට යොදා ඇති රළපනාව වැවක දක්නට ලැබේ.
(3) විශාල වැව්වල ඉදිකළ රළපනාව වැව් ඇතුළ සේදීම වැළැක්වීමට යෙදූ ගල්පඩි රැසකි.
(4) රළපනාව ඇත්තේ විශාල වැව්වල පමණි. එයින් රළි පැමිණ වැව් බැම්ම සේදීයාම වැළැක්වේ.

(36) සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාවෙහි දක්නා ලද විශේෂත්වය නම් ගීතය මගින් මිනිසුන් අතර වන සබඳතා සියුම් ලෙස නිර්මාණය කොට දැක්වීමට ගන්නා ලද වෑයමයි.
(1) ගීතය මගින් මිනිස් සබඳතා නිර්මාණය කිරීම යථාර්ථවාදී ප්‍රවණතාවෙහි දරන ලද විශේෂත්වයකි.
(2) සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාවෙහි විශේෂ ලක්ෂණය නම් මිනිස් සබඳතා සූක්ෂ්ම ලෙස පෙන්වීමට ගත් උත්සාහයයි.
(3) මිනිස් සබඳතා සියුම් ලෙස නිර්මාණය කිරීමට සිංහල ගීතය උත්සාහ ගත් බව නොකියාම බැරි ය.
(4) සිංහල ගීතයේ දියුණුව පෙන්වන්නේ මිනිස් සබඳතා යථාර්ථවාදීව ගෙන හැර දැක්වීමට පසුගිය කාලයේ ගත් දැඩි වෙහෙසයි.

(37) පද බෙදා ලිවීම අනුව වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) අපගේ ආදිම සිංහලයෝ සීගිරියේ සුසිනිඳු සුමට කැටපත් පවුර මත ස්වකීය ගී ලියාතැබූහ.

(2) ශ්‍රී කාන්තාතොමෝ ලෝ වැස්සන්ට නිති යස ඉසුරු ගෙන දෙති.

(3) උසස් සාමාර්ථයක් ලබාගත් සුජානි දක්ෂතම ශිෂ්‍යාවට හිමි ත්‍යාගය දිනා ගත්තාය.

(4) යම් සාහිත්‍ය නිර්මාණයක් මුලින් ම මැවෙන්නේ කවියාගේ සිතෙහි ය.

◆ අංක 38. 39 ප්‍රශ්නවල මුල් පදය දෙවන පදය සමඟ ගළපන විට අර්ථයෙන් සමාන ද විරුද්ධ ද. වෙනස් ද වැඩි ද යන්න තෝරන්න.

(38) තරුණ - තරණ

(1) විරුද්ධ (2) වැඩි (3) වෙනස් (4) සමාන

(39) අස්වාමික - සස්වාමික

(1) විරුද්ධ (2) වැඩි (3) වෙනස් (4) සමාන

(40) පහත ප්‍රාදේශීය ව්‍යවහාර නිවැරදිව අර්ථ ගත්වා නොමැති පද සහිත වරණය තෝරන්න.

(1) බක්කම්මා - ලොකු අම්මා , සකලයෝ - කුරුල්ලෝ , දැවා - දැම්මා

(2) හිච්චි - කුඩා , වැවර - කුරුම්බා , සෝමාරියා - කම්මැලියා

(3) වෛතාලෙන් - උදෙන් , හැන්නදි රාළ - ඔරු අයිතිකරු , සුම්බරේ - ජටාව

(4) බාගෙදා - සමහර විට , මඩක්කුව - කරත්තය , ගොම්පස් - හුඹස් මැටි

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
**Western Province Education Department - Colombo Educational Zone**

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
**Second Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / **Paper** | **II** | කාලය / காலம் / **Time** | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එම ප්‍රශ්න අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) අර්ධ අනුනාසික්‍ය අක්ෂර දෙකක් සහ අන්තඃස්ථාක්ෂර දෙකක් ලියන්න.

(ii) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට ලියන්න.

(අ) අති + අවශ්‍ය (ආ) මුගු + ඇට

(iii) පහත සඳහන් පද සඳහා විරුද්ධ පද ලියන්න.

(අ) මහේච්ඡ (ආ) සාවද්‍ය

(iv) පහත දැක්වෙන වාක්‍යවල එකම පදය අර්ථ දෙකක් සපයයි. එම අර්ථ වෙන් වෙන්ව ලියන්න.

(අ) පැරකුම්බා රජ <u>සමය</u> පුරා රට සහලින් ස්වයංපෝෂිත වූ බව සඳහන් වේ.

(ආ) වැලිවිටියේ ශ්‍රී සෝරත හිමිපාණෝ <u>සමය</u> සමයාන්තර නුවණකින් හෙබියාහ.

(v) පහත දැක්වෙන වාක්‍ය ගැළපීම අතින් වැරදිය. ඒවා නිවැරදි කොට **නැවත** ලියන්න.

(අ) භාෂාව මගිනි අත්දැකීම් පාඨකයාට කරන්නේ ඉදිරිපත් තම සාහිත්‍යකරුවා

(ආ) දීර්ඝ ඉතිහාසයක් පෙරදිග රටවලට ආයුර්වේද ක්‍රමයට ආවේණික තිබේ.

(vi) පහත සඳහන් වාක්‍යයෙහි ඇති සමාස පද දෙක තෝරා ලියන්න.

අගනා ඇත්දළ දෙකක් සහිත ධාතු කරඬුව දුටුවන්ගේ නෙත්සිත් බුද්ධාලම්භන ප්‍රීතියෙන් පුරවාලී ය.

(vii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්ම කාරකයටත් කර්මකාරක වාක්‍යය කර්තෘ කාරකයටත් හරවන්න.

(අ) හෙතෙම වනයට ගොස් පලතුරු කෑවේ ය.

(ආ) මා විසින් දෙගුරුන් නැමදිණි.

(viii) පහත දැක්වෙන නාම පදයේ නාම ප්‍රකෘතිය ද ක්‍රියා පදයේ ධාතු ප්‍රකෘතිය ද ලියන්න.

(අ) සෙහොයුරා (ආ) තැබුවේ ය.

(ix) පහත දැක්වෙන වාක්‍යයෙහි ඇති අව්‍ය පද දෙකක් තෝරා ලියන්න.

මම සුපුරුදු පරිදි මුහුද දක්වා අඩි සලකුණු තබමින් ගමන් කළෙමි.

(x) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.

(අ) වහජ්ජා (ආ) වානහම්

(02) පහත දැක්වෙන අ. ආ, ඉ. ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) මිල අධික. විවිධ සුඛෝපභෝගී භාණ්ඩවලින් දැන් වෙළෙඳපොළ පිරී ඇති බව සැබෑ ය. එසේ වූ පමණින් මේ සියලු දේ අපට ප්‍රයෝජනවත් නොවේ. අප යමක් මිල දී ගත යුත්තේ අපේ මහත්තත්ත්වය ලොවට ප්‍රකාශ කිරීමට නොව අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා ය. චාම් ජීවිතයකට හුරු පුරුදු වීමෙන් මානසික සුවයක් ද ලැබේ.

(ආ) පටු අපේක්ෂාවන්ගෙන් යුක්ත වීම හා තරගකාරීත්වය නිසා සිදුවන රිය අනතුරු ගැන අද නිතර අසන්නට ලැබේ. මෙය සැබවින් ම ඛේදවාචකයකි. වටිනා ජීවිත බිලිගන්නා මෙවැනි අනතුරු අවම කරගත යුතු ය. නීතිමය පියවර ගැනීමට පමණක් නොව මිනිස් ජීවිතවල අනාගත සුබ සිද්ධිය පිණිස කඩිනම් පිළියම් යෙදිය යුතු ය.

(ඉ) මානව නිර්මාණ අතරින් විශිෂ්ටතම නිර්මාණය වන්නේ භාෂාවයි. මිනිසා භාෂාව නිර්මාණය කර ගත්තේ කවදා කෙසේ ද යන්න ඉඳුරා කිව නොහැකි වුවත් එය අපූරු මෙවලමකි. එසේම අන් සියලු නිමැයුම් සඳහා මූලාශ්‍ර වූයේ ද එයමයි.

(ඊ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මගින් ප්‍රතිකාර කරන්නේ රෝග ලක්ෂණයට නොව රෝග නිදානයටයි. ඒ හේතුවෙන් ලොව බොහෝ රටවල් මේ වෛද්‍ය ක්‍රමය පිළිබඳ විශ්වාසය තබා ඇත. ශ්‍රී ලාංකික අපට ද ආයුර්වේදය ආගන්තුක නොවන බව ඉතිහාසය සාක්ෂ්‍ය දරයි. ඒ පිළිබඳ දැනුවත් වීම අප කාටත් ප්‍රයෝජනවත් ය.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජාතක කතා වස්තු සිංහල කවීන්ට කථා රත්නාකරය විය. ප්‍රතිමා නෙළූ ප්‍රතිමා ශිල්පීහු සිතැඟි පරිදි ගල්කටුවෙන් හැඩගැස්විය හැකි පාෂාණ පර්වතයන්ට ඇදී ගියාක් මෙන් සිංහල කවිහු ද කව් මිණි දම් ගෙතීමට ජාතක කථාර්ණවයට ම බැස්සෝ ය. මෙම කථාවස්තු කවීන්ට පුරා විද්‍යාඥයන්ට මෙන් ම මානව විද්‍යාඥයන්ට ද එක සේ ප්‍රයෝජනවත් ය. නා නා විධ මනුෂ්‍ය චරිත රාශියකින් යුතු ජාතක කතා පොත කියවීමෙන් සියක් අවුරුද්දක් ජීවත්වීමෙනුදු නොදත හැකි මනුෂ්‍ය ජීවිතය පිළිබඳ අපූරු තොරතුරු රාශියක් දත හැකි ය. මනුෂ්‍යාත්මභාවයෙහි සුන්දරත්වය ද භයංකාරත්වය ද ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ මෝඩකම්, දූෂ්ටකම් හා කුරිරුකම් ද ශ්‍රද්ධා භක්තිය ද පිළිබඳ තොරතුරු ජාතක වස්තුන්හි ඇතුළත් වේ. අප්‍රබුද්ධ ජනකාය තුළ ද පොත පත කියවීමේ ආශාවක් හා බණ ඇසීමේ ආශාවක් මේ නිසා ඇති විය.

(1) ජාතක කතා තම නිර්මාණ සඳහා දායක කරගත්තෝ කවරහු ද?
(2) මෙහි දැක්වෙන පොදු මිනිස් දුර්වලතා දෙකක් ලියන්න.
(3) මෙහි දැක්වෙන උපමාව සහ උපමේය වෙන් වෙන් ව ලියන්න.
(4) ජාතක කතා කියවීමෙන් ලද හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
(5) පහත දැක්වෙන වචනවල අරුත් පැහැදිලි කරන්න.
(අ) කථාර්ණවය (ආ) අප්‍රබුද්ධ (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

රස වින්දනයට බස දැනගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රස වින්දනය හේතු කොටගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වේ. මක්නිසා ද යත් බස ඉතා සූක්ෂ්ම ලෙස පරිහරණය කරන්නේ කවීන් වන බැවිනි. කවියා භාෂාවේ ඇති මුළු ශක්‍යතාවෙන් ප්‍රයෝජන ගන්නා කෙනෙකි. පිසමන් දන්නා අරක්කැමියා නොයෙක් ද්‍රව්‍ය ගෙන නොයෙක් අයුරින් මිශ්‍ර කොට අපූරු රසයෙන් යුත් අහර පිසින්නා සේම කවියා ද නොයෙක් වදන් ගෙන, නොයෙක් අරුත් ගෙන. විවිධ ලෙස මිශ්‍ර කොට, පෙර නොවූ විරූ ව්‍යංග්‍යාර්ථ ශබ්ද ධ්වනි ඇති කොට අපූරු රසයක් නිර්මාණය කරයි.

එබැවින් කාව්‍ය විචාරය යි කිව යුත්තේ කාව්‍ය රස වින්දනයේ මනා පරිචය ඇති අයගේ ප්‍රකාශනයට විය

යුතු ය. එම ප්‍රකාශනවලින් විවිධ රස විඳ පළපුරුද්දක් ඇති අයට එබඳු වින්දනයකට මග පෑදේ. සාමාන්‍ය ලෝකයට විෂය නොවූ වින්දනයක් යම් කාව්‍යයක ඇතැයි විචාරකයා තමාගේ ප්‍රකාශනය සනාථ කිරීම වස් යම් යම් හේතු දක්වයි. එහෙත් ඔහු තර්කානුකූල න්‍යායයන් අනුගමනය නොකරයි. රසය චූකලී භාවමය වින්දනයකි. එය තර්ක බුද්ධියට හසුවන සත්‍යයක් නොවේ. විචාරකයා කියන්නේ අසවල් කවියෙන් අසවල් වින්දනය ලබාගත හැකිය කියා ය. ඒ අනුව මම මේ කවියෙන් රස වින්දනයක් ලැබුවෙමි. ඔබට ද එබඳු වින්දනයක් ලැබිය හැකිය. යනුවෙන් ඔහු පවසයි.

(ලකුණු 10)

(05)

> "ස්වාභාවික මල් සපයන්නන් සඳහා අපනයන වෙළෙඳපොළ විවෘත වී ඇත. වැඩි විස්තර දැන ගැනීම සඳහා විමසන්න.
>
> කළමනාකරු,
> ලක්සල ආයතනය.
> කොළඹ 07.

ඉහත දැන්වීමට අනුව සැපයිය යුතු මල් වර්ගවල තත්ත්වය. ගුණාත්මක බව, ඇසුරුම් ක්‍රම සහ ලැබෙන මිල ගණන් පිළිබඳව විමසමින් ප්‍රදේශයේ මල් සපයන්නන්ගේ සංගමයේ ලේකම් ඔබ යැයි සිතා ලිපියක් ලියන්න. (වචන 100 - 125 අතර සෑහේ)

නැතහොත්

ඇතැම් ගුවන්විදුලි නාලිකාවන්හි නිවේදක නිවේදිකාවන් භාවිත කරන හරසුන් භාෂාව පිළිබඳ ව කරුණු දක්වමින් පුවත්පතකට තීරු ලිපියක් ලියන්න.

(ලකුණු 15)

(වචන 100 - 125 අතර විය යුතු ය. තීරු ලිපි ලිවීමේ නිවැරදි ශිල්පීය ක්‍රමය අනුගමනය කරන්න.)

The National e-learning Portal for The General Education

(ලකුණු 2×5 = 10)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
**Western Province Education Department - Colombo Educational Zone**

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
**Second Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "මේ මිනිහා මොකක් හෝ හේතුවක් අල්ලාගෙන කුළීකරුවන්ගේ පඩි කපන කලාව හොඳින් දැන සිටියේ ය.
  (අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.
  (ආ) මෙහි "මේ මිනිහා" යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(ii) "තෙපි ඇම මා කුමක් නිසා ඇල්වූයෙහිදැ"
  (අ) මේ ප්‍රශ්නයට ලැබුණු පිළිතුර කුමක් ද?
  (ආ) ඉන් පසුව කථකයා විසින් කරන ලද ඉල්ලීම කුමක් ද?

(iii) "මට කිසිම යුතුකමක් නැහැ රාලහාමිගෙන් මෙහෙම උදව්වක් බලාපොරොත්තුවෙන්න."
  (අ) මෙසේ බලාපොරොත්තු වූ උදව්ව කුමක් ද?
  (ආ) 'රාලහාමි' යන්නෙන් හඳුන්වන පුද්ගලයාගේ නම ලියන්න.

(iv) "තැවී අද වියෝ ගින්නෙන් ළැම තදිනේ
ගෙවී ගියේ දෝ ඉරණම හිමි සඳිනේ"
  (අ) ඉහත පද්‍යයේ මුල් පද්‍ය පාද ලියන්න.
  (ආ) 'සඳ කිඳුරු දා කව' සිංහල පද්‍ය සාහිත්‍ය ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයක් ලෙස සැලකීමට හේතු වූ කාරණය ලියන්න.

(v) පහත දැක්වෙන ග්‍රන්ථවල කතුවරුන් නම් කරන්න.
  (අ) කුණාටුව
  (ආ) සද්ධර්මරත්නාවලිය

(vi) "උන්දැගෙන් යමක් ඉල්ලා ගන්න එක ගලෙන් පට්ටයක් ගන්නවට වඩා අමාරුයි."
  (අ) ඉල්ලා ගන්නට සිතුවේ කුමක් ද?
  (ආ) මෙහි "උන්දෑ" යනුවෙන් කියැවෙන පුද්ගලයා නම් කරන්න.

(vii) "තෙල් බින්දුවට පවා මේ සා වූ ලෝභ කරන්නාහු මට දියයුතු කුලී කෙසේ නම් දීපියහෙද්දැ"
  (අ) මෙය කාගේ සිතිවිල්ලක් ද?
  (ආ) ලෝභ කරන තැනැත්තා / තැනැත්තිය සිටින නුවර ලියන්න.

(viii) (අ) දෙවන පැරකුම් රජු තම රාජ්‍යයෙන් පිදුම් දුන් සාහිත්‍ය ග්‍රන්ථය කුමක් ද?
  (ආ) 'වසන්ත සමය' පද්‍ය පන්තිය ඇතුළත් කාව්‍ය සංග්‍රහය නම් කරන්න.

(ix) "සැදෑ ඇතත් සමහර කෙනෙක් සංග්‍රහසීලී නොවන හෙයින් සංග්‍රහ කට නොහෙති"

(අ) මෙසේ සිතුවේ කවුරුන් ද?

(ආ) මේ සංග්‍රහය නිසා ලැබූ එක් ප්‍රතිලාභයක් ලියන්න.

(x) පහත දැක්වෙන කෘති ඇසුරෙන් සම්පාදනය වූ ගද්‍ය ග්‍රන්ථ නම් කරන්න.

(අ) ජාතකට්ඨ කථාව

(ආ) පාලි රසවාහිනිය

(02) **පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.**

(i) ''**උදකරක්ඛසින්ට** වාසස්ථාන වූ තෘෂ්ණා නමැති ගංගා ජලයට පිහිට වූ රූප ශබ්දාදි පඤ්චකාම කොට්ඨාස නැමැති **සුළාවැටුම්** ඇති"

(ii) ''හමන සුවඳ සිහිලස **ලිය මඬුලු** වලා
ගිමන නිබඳ සතපා උනිමු ලොබ වලා
එවන මෙ සඳෑ තැවුලිය **ලැවු ගිනි** සෙ වලා
කුමන සැප ද වින්දේ හිමි සමග වලා''

(iii) "**බැවහර** රනින් විස්සෙක් නම් **නීල කර්ෂාපණයෙන්** එකෙක් වෙයි. තුන් ලක්ෂ විසිදහසක් මසුරන් දෙන්නාහු"

(iv) ''ඔයින් මෙයින් ඔහේලගෙ තාත්තගෙ සීයගෙ **ගොයියො** අවුරුදු හතළිහක් ම මේක **බුක්ති වින්දා.** බුක්ති වින්දා විතරක් නෙවෙ, ඒක ඒ ගොල්ලන්ගෙ ම හැටියටයි වැඩ කළේ''

- **03, 04 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ සෑහේ.**

(03) යසෝදරාවත රසවත් නිර්මාණයක් වීමට හේතු පාදක වූයේ,

(අ) උචිත කාව්‍යෝක්ති භාවිත කිරීම

(ආ) ජනශ්‍රැතියේ එන විශ්වාස පදනම් කර ගැනීම

යන කරුණු ය. නියමිත කොටසින් එක කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්,**

තම සැමියාගේ වියෝවෙන් කිඳුරියගේ සිතෙහි ජනිතවන

(අ) ශෝකය මුසු වූ කෝපයත්

(ආ) ප්‍රියයාගෙන් වෙන්වීමේ දුකත්

මනා ලෙස දැක්වීමට කතුවරයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(04) 'වේදබ්භ ජාතකය' තුළින් නිරූපණය වන්නේ,

(අ) අනුන් සතු දේ පැහැරගැනීමේ ආදීනවත්

(ආ) උපායශීලී වීමේ ප්‍රයෝජනත් ය.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් උක්ත කියමන් පැහැදිලි කරන්න.

**නැතහොත්,**

(අ) ස්ථිර අධිෂ්ඨානයෙන් වැඩ කටයුතු කිරීමෙන් සාර්ථකත්වයට ළඟා විය හැකි ආකාරයත්

(ආ) ප්‍රායෝගික ජීවන අත්දැකීම්වලින් හීන වීමේ ගැටලුවත්

'හත්ථ හත්තික සිටාණන්ගේ කතාව' තුළින් පැහැදිලි කිරීමට කතුවරයා ගත් උත්සාහය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

◆ 05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන 100ක් පමණ සෑහේ.

(05) සාර්ථක ලෙස සංකේත භාවිත කිරීමෙහිලා කතුවරයා සතු දක්ෂතාව 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාව ඇසුරින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(06) 'වැස්ස' පද්‍ය පන්තිය තුළින් නිරූපණය වන්නේ වැස්ස නිසා ප්‍රබෝධයට පත්වූ කවියෙකුගේ චිත්තාවලියයි. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(07) සමාජ විෂමතාව පිළිබඳ බරපතල ගැටලුව මනා සංයමයෙන් යුතුව නිරූපණය කිරීමට මොනිකා රුවන්පතිරණ කිවිඳිය සමත් වී ඇත. අදාළ උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.